කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2017

8 ශ්‍රේණිය | විද්‍යාව I,II | කාලය : පැය 02

නම :...

- *සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න*
- *නිවැරදි හෝ වඩාත් ගැලපෙන වරණය තෝරා යටින් ඉරක් අඳින්න*

01. ආහාර සංචිත කරන භූගත කඳන් අඩංගු පිළිතුර වන්නේ,
    1. කැරට් හා අර්තාපල් ය.
    2. බතල හා ඉන්නල ය.
    3. ඉඟුරු හා ගහල ය.
    4. බීට් හා කැරට් ය.

02. අරීය සමමිතියක් දක්වන සත්ත්වයෙකි.
    1. කුඩැල්ලා.
    2. මුහුදු මල.
    3. ගොළුබෙල්ලා.
    4. සමනලයා.

03. සෙම්ප්‍රතිශ්‍යාවේ රෝග කාරකය වන්නේ,
    1. දිලීරයකි
    2. වෛරසයකි
    3. බැක්ටීරියාවකි
    4. ප්‍රොටොසෝවාවෙකි

04. අවස්ථා විපර්යාසයක් සිදුවන්නේ පහත සඳහන් කුමන අවස්ථාවේදීද?
    1. හුමාලය සිසිල් කිරීම.
    2. මැග්නීසියම් පටියක් දහනය කිරීම.
    3. කොපර් සල්ෆේට් ද්‍රාවණයකට යකඩ ඇණයක් දැමීම.
    4. තනුක හයිඩ්‍රොක්ලෝරික් අම්ලයට සින්ක් කැබැල්ලක් දැමීම.

05. A - පරිපථයක ධාරාව ඇමීටරයෙන් මනිනු ලැබේ.
    B - ධාරාව මනින ඒකකය ඕම් වේ.
    C - ප්‍රතිරෝධය ඇමීටරයෙන් මනිනු ලැබේ.

    මින් නිවැරදි ප්‍රකාශය /ප්‍රකාශ වනුයේ,

    1. A -පමණි. 2. B -පමණි. 3. B,C -පමණි. 4. A,C -පමණි.

06.



A B C

A,B,C – රූප වල අංශු සැකැස්මට ගැලපෙන්නේ කුමණ පිළිතුර ද?
1. ජලය, යකඩ, වාතය
2. වාතය, ජලය, යකඩ
3. යකඩ, ජලය, වාතය
4. යකඩ, වාතය, ජලය

07. ජලය හා පොල්තෙල් ඝණත්ව කුප්පියකට සම්පූර්ණයෙන් පුරවා වෙන වෙනම ස්කන්ධයන් මැනගන්නා ලදි. ජලය පුරවා ඇති විට වැඩි ස්කන්ධයක් ඇති බව නිරීක්ෂණය විය. මෙයින් ගත හැකි නිගමනය වන්නේ,
1. ජලයට වඩා පොල් තෙල් ඝණත්වයෙන් වැඩි බව යි.
2. ජල බඳුනකට පොල් තෙල් දැමූ විට ජලය පොල් තෙල්වල පාවෙන බව යි.
3. පොල් තෙල් හා ජලයේ ඝණත්වය සමාන වන බව යි.
4. පොල් තෙල්වලට වඩා ජලයේ ඝණත්වය වැඩි බව යි.

08. ගෙන්දගම් සතු ලක්ෂණයක් වන්නේ,
1. ආහන්‍යතාවක් පැවතීම.
2. තාපසන්නායකතාවක් පැවතීම.
3. භංගුරතාවයක් පැවතීම.
4. විද්‍යුත් සන්නායකතාවක් පැවතීම.

09. මධ්‍ය ස්නායු පද්ධතියේ කාර්යය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න,
1. ශ්වසන වේගය වැනි අනිච්ඡානුග ක්‍රියා පාලනය - අනුමස්තිෂ්කය
2. දේහය හා මොළය අතර පණිවිඩ සම්ප්‍රේෂණය - සුෂුම්නා ශීර්ෂකය
3. දේහ සමතුලිතව පවත්වා ගැනීම - සුෂුම්නාව
4. මතකය වැනි උසස් මානසික කෘත්‍ය පාලනය - මස්තිෂ්කය

10. 8 ශ්‍රේණියේ සිසුන් සර්වසම බල්බ හා කෝෂ යොදා සැදූ පරිපථ සටහන් 4ක් පහත දැක් වේ.



ඉහත පරිපථ පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න.
1. A හි බල්බයට වඩා B හි බල්බයේ දීප්තිය වැඩිය.
2. A ඇටවුමෙහි කෝෂ ශ්‍රේණිගතව සම්බන්ධ කර ඇත.
3. C බල්බ වලට වඩා D බල්බ වල දීප්තිය වැඩිය.
4. D වල බල්බ සමාන්තරගතව සම්බන්ධ කර ඇත.

11. රූපයේ දැක්වෙන ඇටවුමෙන් පරීක්ෂා කරන්නේ විද්‍යුත් ධාරාවේ කුමන ඵලය ද?
1. විද්‍යුතයේ රසායනික ඵලය.
2. විද්‍යුතයේ තාපන ඵලය.
3. විද්‍යුතයේ චුම්භක ඵලය.
4. විද්‍යුතයේ ප්‍රකාශ ඵලය.



12. 

B බල්බය දැල්වීමට සංවෘත (ON) කළ යුතු යතුරු වන්නේ,

1. K_1, K_4
2. K_1 K_2
3. K_2 K_3
4. K_2 , K_4

13. මිනිසාගේ ශ්‍රව්‍යතා සීමාවට අදාලව නිවැරදි පිළිතුර වන්නේ,

1. 20Hz ට වඩා අඩු ය..
2. 20, 000Hz ට වඩා වැඩි ය.
3. 25, 000Hz-70, 000Hz අතර ය
4. 20Hz - 20, 000Hz අතර ය

14. විද්‍යුත් චුම්භක භාවිතාවන උපකරණයකි.
1. මාලිමාව
2. සරල ධාරා විදුලි මෝටරය
3. විදුලි සීනුව
4. බයිසිකල් ඩයිනමෝව

15. විද්‍යුත් චුම්බකයක ප්‍රබලතාව වැඩිවන්නේ,
1. දඟරයේ පොටවල් ගණන වැඩි කිරීමෙනි.
2. දඟරයේ පොටවල් ගණන අඩු කිරීමෙනි.
3. දඟරයේ මධ්‍යයේ පරිවාරක මාධ්‍යයක් යෙදීමෙනි.
4. දඟරය හරහා අඩු ධාරාවක් ගමන් කිරීම මගිනි.

16. 

* **නලය රත් කිරීමට පෙර**
ගිනිකූරු සහිත පරීක්ෂානලය + බැලූනයේ ස්කන්ධය = $m_1 g$
* **නලය රත් කිරීමෙන් පසු**
දැවුනු ගිනිකූරු සහිත පරීක්ෂානලය + බැලූනයේ ස්කන්ධය = $m_2 g$

m_1 හා m_2 පිළිබඳ සත්‍ය වන්නේ

1. m_1 ට වඩා m_2 ස්කන්ධය අඩුය.
2. m_2 ට වඩා m_1 ස්කන්ධය අඩුය.
3. m_1 හා m_2 ස්කන්ධ සමානය

4. m_1 හා m_2 ස්කන්ධ ආසන්න

17. යකඩ ගැල්වනයිස් කිරීමට භාවිතා කරන මූලද්‍රව්‍යය කුමක් ද?

1. සින්ක්
2. මැග්නීසියම්
3. ටින්
4. සෝඩියම්

18. එක්තරා සත්ත්වයෙකුගේ පහත ලක්ෂණ දක්නට ලැබුණි.

- දේහය ද්විපාර්ශ්වික සමමිතියක් දරයි.
- සන්ධි සහිත උපාංග ඇත.
- දේහය මතුපිට බාහිර සැකිල්ලක් ඇත.

මෙම සත්ත්වයා අයත් සත්ත්ව කාණ්ඩය වන්නේ,

1. ආවේස් ය.
2. ආත්‍රාපෝඩා ය.
3. ඇම්ෆිබියා ය.
4. පිස්කේස් ය.

19. බලශක්ති අර්බුදයක් පවතින මෙවැනි යුගයක බලශක්තිය පිරිමැසීමට ඔබට ගතහැකි ක්‍රියාමාර්ගයන් කිහිපයක් පහත දැක්වේ.

A . නිවස ආලෝකමත් කිරීමට LED වලින් සෑදූ බල්බ භාවිතා කිරීම.
B . රාත්‍රියේදී පොත් කියවීම සඳහා මේස ලාම්පුවක් භාවිතා කිරීම.
C . රාත්‍රී 6.30 - 9.30 කාලය තුළ ශීතකරණය විසන්ධි කර තැබීම.
D . නිවසේ සාමාජිකයින් වරින් වර ඇඳුම් මැදීම.

මින් බලශක්ති සංරක්ෂණයට දායක වන්නේ,

1. A B පමණි.
2. A C පමණි.
3. AB C පමණි.
4. ABC D යන සියල්ල ම.

20.



මෙහි ඇති ආලෝක සංවේදී ප්‍රතිරෝධකය අතින් වැසූ විට දැකිය හැකි නිරීක්ෂණය වන්නේ,

1. මිලි ඇමීටරයේ දර්ශකය විරුද්ධව අනෙක් දිශාවට උත්ක්‍රමණය වීම ය.
2. බල්බයේ දීප්තිය අඩු වීම ය.
3. බල්බය නිවී යාම ය.
4. බල්බය හා ඇමීටරයේ කිසිදු වෙසනක් සිදු නොවීම ය.

II කොටස

පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.

01. (A) විද්‍යාගාරයේදී ක්ෂුද්‍ර ජීවීන් පිළිබඳව තොරතුරු සොයාබැලීම සඳහා සිදුකල ක්‍රියාකාරකමකට සිසුන් කිහිපදෙනෙකු ගෙන ආ ද්‍රව්‍ය කිහිපයක් පහත දැක්වේ.

ද්‍රව්‍ය සාම්පල	අඩංගු ද්‍රව්‍ය
A	පොකුණෙන් ලබාගත් කොළ පැහැති ජලය
B	සීනි, යීස්ට් ජලයේ මිශ්‍රකර සෑදූ ද්‍රාවනයක්
C	පිදුරු පල් කල ජල සාම්පලයක්
D	දිනක් පමණ වාතයට විවෘතව තැබූ කිරි වීදුරුවක්

i. A හා D බඳුන් තුල අන්තර්ගත විය හැකි ක්ෂුද්‍ර ජීවී කාණ්ඩය බැගින් නම් කරන්න. (ල. 2)
ii. යීස්ට් සෛල අන්වීක්ෂයෙන් පෙනෙන අයුරු දළ රූප සටහනකින් දක්වන්න. (ල. 1)
iii. නැවුම් කිරිවලට වඩා D කිරි සාම්පලයේ දැකිය හැකි වෙනස්කම් 2ක් දක්වන්න. (ල. 2)
iv. සීනි පැසීමේ ක්‍රියාවලියේ දි සෑදෙන වායුමය නොවන ඵලය කුමක්ද? (ල. 1)

(B) නාගරික ප්‍රදේශ වල එක් රැස්වන කසල ජෛව හායනය සඳහා බැක්ටීරියා විශේෂයක් අඩංගු දියරයක් එක් කරයි.

i. නගරයේ එක්රැස්වන කසල භාවිතා කර නිපදවිය හැකි ප්‍රයෝජනවත් නිෂ්පාදනයක් නම් කරන්න. (ල. 1)
ii. බැක්ටීරියා වර්ධනය සඳහා තිබිය යුතු හිතකර සාධක 2ක් දක්වන්න. (ල. 2)
iii. වෛද්‍ය විද්‍යාවේදී ක්ෂුද්‍ර ජීවීන් භාවිතයට ගෙන සිදුකරන නිෂ්පාදනයක් නම් කරන්න.(ල.1)

(C) ක්ෂුද්‍ර ජීවී ක්‍රියා නිසා ආහාර නරක් වීම පාලනය කිරීමට විවිධ උපක්‍රම යෙදෙයි.

i. ශීතකරණයේ ආහාර ගබඩා කිරීමෙන් පාලනය වන සාධක 2ක් දක්වන්න. (ල. 2)
ii. සීනි ද්‍රාවණය තුළ බහාලීමෙන් කල්තබා ගත හැකි ආහාරයක් ලියන්න. (ල. 1)
iii. ප්‍රෝටීනමය ආහාර මත ක්ෂුද්‍ර ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය කුමන නමකින් හඳුන්වයි ද? (ල. 1)
iv. සීනි ද්‍රාවණයකට යීස්ට් එක්කර ටික වේලාවකට පසු දැකිය හැකි නිරීක්ෂණ 2ක් ලියන්න (ල. 2)

02. (A) ශාක වල විවිධ කොටස් වලින් වර්ධන ප්‍රචාරණය මෙන්ම තවත් කාර්යයන් සිදු වේ.

i. වර්ධක ප්‍රචාරණය යනු කුමක්ද? (ල. 1)
ii. අක්කපාන ශාකයේ වර්ධක ප්‍රචාරණය සිදුවන්නේ එම ශාකයේ කුමන කොටසින්ද? (ල. 1)
iii. ඕකිඩ් පැලයක් රෝපනය කර ඇති බඳුනකින් පිටතට වැඩී නිදහස්ව එල්ලී පවතින මුල් වලින් සිදුකරන කාර්යය කුමක්ද? (ල. 1)
iv. වැටකෙයියා ගසක කයිරු මුල් වලින් එයට ලැබෙන ප්‍රයෝජනයක් ලියන්න. (ල. 1)

(B)



රූපයේ දැක්වෙන්නේ ලූනු බල්බයක දික්කඩකි.

i. එය භූගත කඳක් ලෙස සැලකෙන්නේ ඇයි? (ල. 1)
ii. එහි a සහ b කොටස් නම් කරන්න. (ල. 1)
iii. ගම්මිරිස් වැලක් ආධාරකයේ එතීමක් සිදුනොවේ. එය ඉහළට වැඩීමට උපයෝගි කර ගන්නා අනුවර්තනය කුමක් ද? (ල. 1)
iv. ආහාර සංචිත කරන වායව කඳන් දරන ශාකයක් නම් කරන්න.(ල. 1)



(C) ශාක පත්‍රයක දළ රූප සටහනක් මෙහි දැක් වේ.

i. a හා c කොටස් නම් කරන්න (ල. 1)

ii. ශාක පත්‍ර ප්‍රභාසංස්ලේෂණය සඳහා දක්වන අනුවර්තන (හැඩගැසීම්) 2ක් ලියන්න. (ල.2)

03. (A) i. "බහිස්‍රාවය" කෙටියෙන් හඳුන්වන්න. (ල. 1)

ii. පහත එක් එක් ඉන්ද්‍රියෙන් බැහැරවන බහිස්‍රාවී ඵල නම් කරන්න. (ල. 1)

a වෘක්ක b සම

iii. මිනිස් සිරුරෙන් බැහැරවන ප්‍රධාන නයිට්‍රජනීය බහිස්‍රාවී ද්‍රව්‍යය කුමක්ද? (ල. 1)

iv. වෘක්ක නිරෝගීව පවත්වාගැනීමට අනුගමනය කලයුතු සෞඛ්‍ය පුරුදු 2ක් ලියන්න. (ල. 2)

(B) මිනිසාගේ සම බහුකාර්ය ඉන්ද්‍රියකි.

i. සම සෑදී ඇති කොටස් 2ක් නම් කරන්න (ල. 1)

ii. බහිස්‍රාවය හැර සමෙන් වෙනත් සිදුකෙරෙන කාර්යයක් ලියන්න. (ල. 2)

(C) i. ඉන්ද්‍රිය සමායෝජනය යනු කුමක්දැයි කෙටියෙන් හඳුන්වන්න. (ල. 1)

ii. මිනිස් සිරුරේ ප්‍රධාන සමායෝජන ක්‍රම දෙක මොනවාද? (ල. 2)

04. චුම්භකත්වය යනු ඇතැම් ද්‍රව්‍ය සතුවන භෞතික ගුණයකි.

(A) විද්‍යාගාරයේදී මේසයක් මත පහත සඳහන් ද්‍රව්‍ය තබා තිබුණි.

- ඇලුමිනියම් කැබැල්ලක්
- තඹ කම්බියක්
- වානේ කම්බියක්
- මිනිරන් කූරක්
- යකඩ ඇණයක්
- ඊයම් කම්බියක්

i. ඉහත ද්‍රව්‍ය අතරින් චුම්භක ගුණ දක්වන ද්‍රව්‍ය 2ක් වෙන් කර ලියන්න. (ල. 2)

ii. දණ්ඩ චුම්බකයක් වටා පිහිටි චුම්භක ක්ෂේත්‍රය ආදර්ශනයට පහත ක්‍රියාමාර්ග අනුගමනය කරන ලදි.

a දණ්ඩ චුම්බකයට ඉහළින් කඩදාසියක් තැබීම.

b කඩදාසිය මතට යකඩ කුඩු ඉසීම. c කඩදාසියට සෙමින් තට්ටු කිරීම.

මෙහිදී දණ්ඩ චුම්බකය වටා යකඩ කුඩු ව්‍යාප්ත වන අයුරු දළ රූප සටහනකින් දක්වන්න. (ල. 2)

iii. ධ්‍රැව හඳුනානොගත් චුම්භකයක ධ්‍රැව වෙන්කර හඳුනාගැනීමට මාලිමාවක් භාවිතා කළ විට ලැබුණු නිරීක්ෂණ (a) හා (b) රූපසටහනින් දැක් වේ.
X හා Y ධ්‍රැව නම් කරන්න (ල. 2)



(B) සන්නායකයක ප්‍රතිරෝධය එය තුළින් ගලා යන ධාරාව කෙරෙහි බලපාන බව සොයාබැලීමට සකස්කළ ඇටවුමක රූප සටහනක් පහත දැක්වේ.



A හා B අග්‍ර 2කට දිගින් හා විශ්කම්භයෙන් සමාන තඹ කම්බියක් හා නික්‍රෝම් කම්බියක් වෙන වෙනම සම්බන්ධ කර බල්බයේ දීප්තිය හා ඇමීටරයේ පාඨාංක ලබා ගන්නා ලදි.

i. බල්බයේ දීප්තිය වැඩිම වන්නේ කුමන කම්බිය AB හිඩසට සම්බන්ධ කල විටදී ද?(ල. 1)

ii. එම නිරීක්ෂණයට හේතුව කුමක් ද? (ල. 1)

iii. සන්නායකයක ප්‍රතිරෝධය හා ගලායන ධාරාව අතර ඇති සම්බන්ධය ලියන්න.(ල. 1)

iv. ඉහත පරිපථය පිටපත් කර බල්බයේ විභව අන්තරය සොයා බැලීමට වෝල්ට් මීටරයක් සම්බන්ධ කරන ආකාරය ඇඳ දක්වන්න. (ල. 2)

05. (A) X ට ගැලපෙන පිළිතුරු Y තීරුවෙන් තෝරා යා කරන්න.

	X	Y
i.	කාබන්ඩයොක්සයිඩ් හා ජලය භාවිතා කරන ක්‍රියාවලියකි.	වායව මුල්
ii.	ශාකයක ඉහළ කොටස් කරා ජලය පරිවහනය ට දායක වන ක්‍රියාවලියකි.	ප්‍රභාසංස්ලේෂණය
iii.	වායු ගෝලයේ වාතය අවශෝෂණය කරන මුල් වර්ගයකි.	වර්ධක ප්‍රචාරණය
iv.	වායු ගෝලයෙන් ජල වාෂ්ප අවශෝෂණය කරන මුල් වර්ගයකි.	වායුධර මුල්
v.	භූගත කඳන් වල කෘත්‍යයකි.	උත්ස්වේදනය

(1x5)

(B) පහත සඳහන් වැකි සත්‍ය නම් 'ස' ද අසත්‍යනම් 'අ' ද වරහන තුල යොදන්න.

i. කොරල් බුහුබාවන් ජලය තුල සංචරණය කරයි. ( )

ii. ස්කන්ධයක් ඇති අවකාශයේ ඉඩක් ගන්නා දේ පදාර්ථ ලෙස හඳුන්වයි. ( )

iii. පදාර්ථයේ අසන්තත ස්වභාවය පරීක්ෂණාත්මකව ලොවට පෙන්වා දුන්නේ ඇරිස්ටෝටල්ය.( )

iv. තාපය සැපයීමේදී ඝනයක් ද්‍රවයක් බවට පත්වන උෂ්ණත්වය තාපාංකයයි .( )

v. ලෝහ පමණක් නොව ඇතැම් අලෝහ ද විදුලිය සන්නයනය කරයි. ( )

vi. සරසුලක දිග වැඩි වන විට එහි සංඛ්‍යාතය ද වැඩිවේ. ( )

(1x6)

06. (A) පරිසරයේ අන්තර්ගත දේ ශක්ති හා පදාර්ථ ලෙස ප්‍රධාන කාණ්ඩ 2කට බෙදේ.

i. ද්‍රව්‍යවල උෂ්ණත්වය ඉහළ නැංවීම සඳහා දායක වන ශක්ති ප්‍රභේදය කුමක්ද? (ල. 1)

ii. පදාර්ථ වල අසන්තත ස්වභාවය තහවුරු කිරීම සඳහා සිදු කල ක්‍රියාකාරකම් දෙකක ඇටවුම් වල දළ රූප සටහන් 2ක් පහත දැක් වේ.

ඇටවුම I



ඇටවුම II



ඉහත ක්‍රියාකාරකම් වලින් ලැබුණ නිරීක්ෂණ හා ඒ ආශ්‍රයෙන් එළඹුන නිගමන පහත දැක්වෙන වගුවේ සටහන් කරන්න.

ක්‍රියාකාරකම	නිරීක්ෂණය	නිගමනය
1	....	....
2	....	....

(ල. 4)

ii. එක්තරා ද්‍රව්‍යයක අංශු සකස්වී ඇති ආකාරය පහත රූප සටහනේ දැක්වේ.



a අංශු සකස්වී ඇති ආකාරය අනුව මෙම පදාර්ථය පවත්නා භෞතික ස්වභාවය කුමක් ද? (ල. 1)

b ඒ අනුව මෙම පදාර්ථය සතුවන සිවිශේෂි භෞතික ගුණය සඳහන් කරන්න. (ල. 1)

(B) ධ්වනිය නිපදවීමේදී කම්පනය වන ස්වභාවය අනුව සංගීත භාණ්ඩ වර්ග 3කට බෙදා ඇත. ඉන් එක් වර්ගයක් පටල කම්පනයෙන් හඬ උපදවන සංගීත භාණ්ඩ ය.

i. පටල කම්පනය වීමෙන් හඬ උපදවන සංගීත භාණ්ඩයක් ලියන්න. (ල. 1)

ii. ගිටාරයක් වාදනය කිරීමේදී ඉන් නිකුත්වන හඬෙහි සංඛ්‍යාතය වැඩිකිරීමට යෙදිය හැකි උපක්‍රමයක් ලියන්න. (ල. 1)

iii. ධ්වනිය පිළිබඳව සිදුකරන ක්‍රියාකාරකම් වලදී භාවිතා වන උපකරණයක දළ රූප සටහනක් පහත දැක්වේ.



256 Hz

a උපකරණය නම් කරන්න. (ල. 1)

b මෙහි 256 Hz ලෙස දක්වා ඇත එහි අදහස කුමක් ද? (ල. 1)

07. (A) මිහිතලයේ විශාල ජීව විවිධත්වයක් පවතී. අධ්‍යයනය කිරීමේ පහසුව සඳහා ජීවීන් වර්ගීකරණය සිදුකර ඇත.

i. සතුන් වර්ගීකරණය කිරීම කෙටියෙන් හඳුන්වන්න. (ල. 2)

ii. ජීවීන් කිහිප දෙනෙකුගේ රූප සටහන් පහත දැක්වේ.







මෙම ජීවීන් අතුරෙන් පහත දැක්වෙන එක් එක් ලක්ෂණ සහිත ජීවියාට අදාළ අක්ෂරය ඉදිරියෙන් ලියන්න.

a කශේරුවක් දැරීම - ....

b ඔත් ජීවිතයක් ගත කිරීම .- ....

c සන්ධි සහිත උපාංග තිබීම .- .... (ල. 3)

iii. රූපාන්තරණයක් දක්වන පෘෂ්ඨවංශී සත්ත්ව කාණ්ඩය නම් කරන්න. (ල. 1)

iv. වවුලා පියාසර කළත්, පක්ෂියෙකු නොවේ.

a මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද? (ල. 1)

b ඔබගේ පිළිතුරෙහි සත්‍යතාවය තහවුරු කිරීම සඳහා වවුලා සතු වන රූපීය ලක්ෂණය 2ක් දක්වන්න. (ල. 2)

v. "මුත්‍රා ගල්" ඇති වීම සඳහා බලපාන හේතුවක් ලියන්න (ල. 1)

vi. වෘක්ක අකර්මන්‍ය වීමේ රෝගය ශ්‍රී ලංකාවේ උතුරු මැද පළාතේ බහුල ලෙස ව්‍යාප්ත වී ඇත. මේ සඳහා බලපා ඇතැයි විශ්වාස කරන ප්‍රධාන සාධකය සඳහන් කරන්න. (ල. 1)